# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2248/37 - 2021 ඔක්තෝබර් මස 06 වැනි බදාදා- 2021.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 2/1976 (iii)

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත**

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 4 (2) (ඊ) සහ 8 (1) වන වගන්ති සමග කියවිය යුතු එම පනතේ 25 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද නියෝග.

**ජයම්පති මොල්ලිගොඩ,**
සභාපති,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

2021 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

(1) මෙම නියෝග 2021 ශ්‍රී ලංකා තේ මණ්ඩල (තේ විශ්ලේෂණ සහ තත්ත්ව සහතික කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ;

(2) ශ්‍රී ලංකා තේ මණ්ඩලය (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් නිමි තේ සහ වෙනත් ආකාරයේ තේ නිෂ්පාදනවල විශ්ලේෂණ සහ තත්ත්ව සහතික කිරීමේ කාර්යය සඳහා පිළිගත් ක්‍රමවේදයක් භාවිතා කරමින් විද්‍යාත්මක පරීක්ෂණ කරගෙන යාමට අවශ්‍ය පරීක්ෂණ සහ වෙනත් පහසුකම්වලින් සමන්විත (මෙහි මින්මතු "පරීක්ෂණාගාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්ලේෂණාත්මක පරීක්ෂණාගාරයක් පිහිටුවා පවත්වාගෙන යා යුතුය.;

(3) පරීක්ෂණාගාරය තුළ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය වන පරිදි යම් නිලධරයන් සහ සේවකයන් සංඛ්‍යාවක්, මණ්ඩලයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකිය.

(4) මෙම නියෝග යටතේ මණ්ඩලයේ බලයලත් නිලධරයකුට, තේ කර්මාන්තශාලාවකට හෝ තේ ගබඩා කර ඇත්තේ යම් වෙනත් ස්ථානයක ද එවැනි යම් ස්ථානයකට ඇතුළු වී ප්‍රශ්න කිරීමට සහ ප්‍රකාශ ලබා ගැනීමට සහ යම් හඳුනාගත් පාර්ශවයක් හෝ

1A - PG 5569 — 445 (2021/10)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

පාර්ශවයන්ගෙන් ලැබෙන වෙනත් යම් ආකාරයේ ලේඛන සම්බන්ධව කටයුතු කිරීමට සහ පරීක්ෂණාගාරය විසින් සිදුකරනු ලබන තේ වල තත්ත්වය පිළිබඳ පරීක්ෂා කිරීමේ සහ විද්‍යාත්මක අනුකූලතාවය පිළිබඳ කාර්යයන් සඳහා සාම්පල් ලබාගැනීමට, බලතල තිබිය යුතු ය.

(5) මණ්ඩලය විසින්, තේ කර්මාන්තශාලාවේ, මෙහෙයුම් පරීක්ෂා කිරීමෙන් පසුව -

(අ) දේශීයව නිෂ්පාදනය කරන ලද හෝ ආනයනය කරන ලද හෝ අලෙවි කරන ලද හෝ බෙදාහැරීම සඳහා සූදානම් කරන ලද නිමි තේ, ප්‍රමිතිකරණයේ අරමුණ සඳහා ජාතික හෝ ජාත්‍යන්තර වශයෙන් පිහිටුවන ලද සහ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතන විසින් නිමි තේ සඳහා නිර්දේශ කරන ලද රසායනික ප්‍රමිතීන්ට අනුකූල ද යන්න නිශ්චය කිරීමට;

(ආ) ජාතික හෝ ජාත්‍යන්තරව පිහිටුවන ලද ආයතනවලින් නිර්දිෂ්ට කරන ලද පරිදි පිළිගත් ක්‍රමවේදයන් භාවිතා කරමින් නිමි තේ වල ක්ෂුද්‍රජීවී අපවිත්‍රවීම්, කෘමි ගහණයන්, ආගන්තුක ද්‍රව්‍යයන් සහ වෙනත් අපවිත්‍රවීම් අඩංගුව පවතින්නේ ද යන්න නිශ්චය කිරීමට;

(ඇ) නිමි තේ වල අඩංගු යැයි සොයා ගනු ලැබූ පළිබෝධනාශක සහ වෙනත් රසායනික ද්‍රව්‍යවල අවශේෂයන්;

(i) තේ පර්යේෂණ ආයතනය හෝ ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ රාජ්‍ය සංවිධාන හෝ ආයතන විසින් නිර්දේශ කරන ලද නිශ්චිතව සඳහන් කරන ලද පළිබෝධනාශක සහ වෙනත් රසායන ද්‍රව්‍යවලට; සහ

(ii) තේ පරිභෝජන රටවල අදාළ පළාත් පාලන ආයතන හෝ ජාත්‍යන්තර මණ්ඩල විසින් නිශ්චිතව දක්වා ඇති පළිබෝධනාශක සහ වෙනත් රසායනික ද්‍රව්‍යවල උපරිම අවශේෂ මට්ටමට (MRL);

අනුකූල වන්නේ ද යන්න නිශ්චය කිරීමට;

(ඈ) නිමි තේ මිනිස් පරිභෝජනයට සුදුසු වන්නේ ද යන්න සහතික කිරීමට;

(ඉ) තේ නිෂ්පාදකයන්ගේ, තේ තැරැව්කරුවන්ගේ, තේ අපනයනකරුවන්ගේ, තේ ආනයනකරුවන්ගේ, තේ ගැණුම්කරුවන්ගේ, තේ විකුණුම්කරුවන්ගේ හෝ තේ කර්මාන්තයට සහ තේ පරිභෝජකයන්ට සම්බන්ධිත වෙනත් යම් පාර්ශව වල නිල ඉල්ලීම මත නිමි තේ වල වෙනත් යම් තත්ත්ව පරාමිතීන් පරීක්ෂා කිරීමට, විශ්ලේෂණය කිරීමට සහ සහතික කිරීමට;

(ඊ) මණ්ඩලයේ පූර්ව අනුමතිය ඇතිව නිෂ්පාදනය කළ නිමි තේ හෝ ප්‍රතික්ෂේපිත තේ මත පදනම්ව ක්ෂණිකව බීමට සුදුසු හෝ ද්‍රව හෝ ඝන යන දෙආකාරයෙන්, යම් ආකාරයක නිෂ්පාදන ලෙසින් වූ තේ වල වූ ද්‍රව්‍යයන් සහ අපවිත්‍රකාරයන් නිශ්චය කිරීමට;

(උ) පරිභෝජනය සඳහා සකස් කළ නිමි තේ වල අඩංගු කෘතීම හෝ ස්වභාවික ආකලන ද්‍රව්‍ය පරීක්ෂා කිරීමෙන් සහ විශ්ලේෂණය කිරීමෙන් ඒවා අවශ්‍ය ප්‍රමිතීන් සපුරා තිබෙන්නේ ද යන්න නිශ්චය කිරීමට;

(ඌ) නිමි තේ සෑදීමේ දී, නිෂ්පාදනයේ දී, සැකසුම් කිරීමේ දී හෝ පිළිගැන්වීමේ දී භාවිතා කළ හෝ භාවිතා කිරීම සඳහා අරමුණු කරන ලදැයි අනුමාන කරන ලද යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් පරීක්ෂා කිරීමට සහ නිශ්චය කිරීමට;

(එ) මණ්ඩලය විසින් දක්වා ඇති විශ්ලේෂිත සහ ප්‍රමිති පරාමිතීන් යටතේ නිමි තේ සහතික කිරීමට;

(ඒ) අවසන් තේ නිෂ්පාදනය පිරිසිදුව බෙදා හැරීම හෝ නැව්ගත කිරීම දක්වා වූ කටයුතුවලදී බලයලත් පහසුකම්වලට අනුව මෙහෙයුම් කටයුතු සහතික කිරීමට,

යන කාර්යන් සඳහා කැමේලියා සිනේසිස් ශාකයෙන් සහ අවසාන තේ නිෂ්පාදනය සෑදීමේ දී නිෂ්පාදනයේ දී, සැකසීමේ දී හෝ පිළිගැන්වීමේ දී භාවිතා කළ හෝ භාවිතා කිරීම සඳහා අරමුණු කරන ලදැයි අනුමාන කළ වෙනත් යම් නිෂ්පාදනයක් හෝ වෙන යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් මගින් නිෂ්පාදනය කළ හෝ ලබාගත් තේ සාම්පල් පරීක්ෂා කිරීමෙන් හෝ විශ්ලේෂණය කිරීමෙන් පසුව මණ්ඩලය විසින් සහතික හෝ විශ්ලේෂණ වාර්තා නිකුත් කළ යුතුය.

(6) මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරන සහ හිතාමතාම වැරදි හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන සහ මණ්ඩලයට සාවද්‍ය සාම්පල් සපයන යම් තැනැත්තකු, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ වරදකට වරදකරුවකු විය යුතුය.

(7) මෙම නියෝග පරීක්ෂණාගාරයේ සේවාවන් ලබාගන්නා සෑම තැනැත්තකුටම අදාළ විය යුතුය.

(8) මෙම නියෝගවල කාර්යයන් සඳහාඃ-

"ආකලන ද්‍රව්‍යයන්" යන්නෙන්, ආහාරවල පැසවීමේ ක්‍රියාවලිය, ආම්ලීකරණ ක්‍රියාවලිය හෝ වෙනත් දිරායාම් නිෂේදනය කිරීමේ, පමා කිරීමේ හෝ අත්හිටුවීමේ හැකියාව ඇතිව යම් ආහාරයකට එකතු කරන ද්‍රව්‍යයන් අදහස් වේ;

"බලයලත් නිලධරයා" යන්නෙන්, මෙම නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලය විසින් විධාන කළ පරිදි කාර්යයන් ඉටු කිරීමට බලය දෙන ලද යම් නිලධරයකු අදහස් වේ;

"ආගන්තුක ද්‍රව්‍ය" යන්නෙන්, උපද්‍රවකාරී හෝ අරමුණු නොකළ ද්‍රව්‍යයන් යන දෙකෙන් එකක් විය හැකි බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් අදහස් වේ;

"ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය" යන්නෙන් පරිගණක භාවිතය සහ සන්නිවේදනය ඇතුළු බොහෝ ව්‍යාපාර කටයුතුවල සහ තාක්ෂණික විද්‍යාවන්ගේ ප්‍රමිතීන් සකස් කරන සංවිධානය අදහස් වේ;

"කෘමි ගහණය" යන්නෙන්, නොකඩවා විශාල ප්‍රමාණයන්ගෙන් කෘමීන් ජීවත් වීම සහ ජීවත්වන හෝ මියගිය කෘමීන් සහ ඔවුන්ගේ බහිස්‍රාවයන් මගින් හෝ මියගිය කෘමීන් හෝ ඔවුන්ගේ බහිස්‍රාවයන්ගේ මාර්ගයෙන් අරමුණු කරන ද්‍රව්‍යයට හානි සිදු වීම අදහස් වේ;

"දේශීය හෝ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්ණායක" යන්නෙන්, කලින් කලට පිළිගත් හෝ සංශෝධනය කරන ලද සියලු දේශීය හෝ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්ණායක අදහස් වේ;

"නිමි තේ" යන්නට, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත මගින් ඊට දී ඇති අර්ථයම තිබිය යුතුය;

"උපරිම අවශේෂ සීමාවන් (MRL)" යන්නෙන්, කොඩෙක්ස් ඇලිමෙන්ටේරියස් කොමිසම හෝ ජාතික නියාමන අධිකාරියක් විසින් සකසා ඇති පරිදි ආහාරයක්, කෘෂිකාර්මික වෙළඳ භාණ්ඩයක් හෝ සත්ව ආහාරයක් තුළ හෝ ඒවා මත පවතින නීත්‍යානුකූලව අනුමත කළ බවට හෝ හඳුනාගනු ලැබූ බවට පිළිගත් පළිබෝධනාශකවල සහ වෙනත් රසායනික ද්‍රව්‍යවල අවශේෂවල උපරිම සාන්ද්‍රණය අදහස් වේ;

"ක්ෂුද්‍රජීවී අපවිත්‍රවීම්" යන්නෙන්, භයානක හෝ රෝගවාහක ක්ෂුද්‍රජීවීන් එකතුවීමෙන් දූෂිතව සාදනු ලැබ ඇති යම් ද්‍රව්‍යයක් අදහස් වේ;

"පළිබෝධකයා" යන්නෙන්, ඍජු හෝ වක්‍ර ක්‍රියාවක් මගින් භෝග සහ අස්වැන්නට අලාභහානි හෝ පාඩු සිදුකරන ජීවියකු අදහස් වේ;

"පළිබෝධනාශක" යන්නෙන්, යම් පළිබෝධකයකු පාලනය කිරීම, වැළැක්වීම, විනාශකිරීම පළවාහැරීම සහ අවම කිරීම සඳහා අරමුණු කරන ලද ද්‍රව්‍යයන් අදහස් වේ.

10-255

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.